**මිල්ලනිය ප්‍රාදේශීය සභාව**
**කළුතර දිස්ත්‍රික්කය**
**--------------------**

**1.** මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
**---------------------------------**

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 ඔක්තෝබර් 02 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 ඔක්තෝම්බර් 27 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ඔක්තෝම්බර් 29 දින ද සභාපතිවරයාට යවා ඇත**.**

1.2 තත්ත්වාගණනය කළ මතය
-------------------------------

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට මිල්ලනිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
-------------------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ---------------------- | ------------ | ---------------------- |
| (i) | සමාලෝචිත වර්ෂයේදී සභාව ස්ථාපිත කිරීම වෙනුවෙන් බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවෙන් ලද රු.4,000,000 ක මුදල සංචිත යටතේ දක්වනු වෙනුවට ගෙවිය යුතු තැන්පතු ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතුවේ. | නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ii) | සමාලෝචිත වර්ෂයට අදාල මූලධන වියදම රු.9,655,089 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනවල රු.9,969,024 ක් ලෙස දැක්වීම හේතුවෙන් මූලධන වියදම රු.313,935 ක් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතුවේ. | නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iii) | සමාලෝචිත වර්ෂයට අදාල පුනරාවර්තන වියදම රු.31,324,229 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනවල රු.30,792,260 ක් ලෙස දැක්වීම හේතුවෙන් පුනරාවර්තන වියදම රු.531,969 ක් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතුවේ. | නිවැරදි කිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (iv) | සමාලෝචිත වර්ෂය තුළදී රු.714,050 කට නිවැරදිව ගිණුම්ගත මිලදී ගත් ස්ථාවර වත්කම් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | නිවැරදි කල යුතුවේ. | කිරිමට කටයුතු කරමි. |

1.4 අනුකූල නොවීම

------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූලනොවීම

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|---|
| (අ) | 2015දෙසැම්බර් 28 දිනැති අංක 1888/47 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය | 124,598 | සභා බල ප්‍රදේශය තුල සවිකර ඇති දැන්වීම් පුවරු 54 කට අදාල ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ගාස්තු අයකල යුතු වේ. | දැන්වීම් පුවරු වලට අදාලව මුදල් ගෙවන ලෙස හා අනවසර පුවරු ඉවත්කර ගන්නා ලෙස දන්වා ඇත. |
| (ආ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛයේ 3.1 ඡේදය | - | සභාව සතු වාහන 06 ක ඉන්ධන දැවීම පරික්ෂා කර නොතිබුණි. | ඉන්ධන දැවීම පරික්ෂා කල යුතු වේ. | එකඟ වෙමි. ඉන්ධන දැවීම පරික්ෂා කිරිමට අදාල රියදුරන් දැනුවත් කර ඇත. |

2. මූල්‍ය සමාලෝචනය

----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.14,189,878 ක් විය.

3 මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

3.1 කාර්ය සාධනය

------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගි සේවා, සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය , පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

ක්‍රියාකාරි සැලැස්ම

---------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (i) 2018 වර්ෂය සඳහා සකස් කළ අයවැය ලේඛනයේ රු.මි. 42.59 ක් වූ පුනරාවර්තන හා ප්‍රාග්ධන වැය සඳහා ක්‍රියාකාරි සැලැස්මක් විධිමත්ව සකස් කර නොතිබුණි. | වාර්ෂික අයවැය ප්‍රතිපාදන අනුව ක්‍රියාකාරි සැලැස්ම පිළියෙල කල යුතු වේ. | අළුතින් සංස්ථාපනය වු සභාවක් බැවින් ප්‍රමාදයන් සිදුවි ඇති අතර 2019 දි නිවැරදි කිරිමට කටයුතු කරමි. |
| (ii) 2018 වර්ෂය තුළ රු.මි.42.59 ක අයවැය ලේඛනය සඳහා සකස් කළ ක්‍රියාකාරි සැලැස්ම තුල හඳුනාගත් වැඩ සටහන් 50 ක් වෙනුවෙන් සකස් කල ක්‍රියාකාරකම් 140 ක් සඳහා වාර්ෂික කාර්ය සාධනය මිණුම් කිරිමේ ක්‍රම වේදයක් නොතිබුණි. | ක්‍රියාකාරි සැලැස්ම තුල හඳුනාගත් වැඩ සටහන් වල වාර්ෂික කාර්ය සාධනය මිණුම් කල යුතු වේ. | අළුතින් සංස්ථාපනය වු සභාවක් බැවින් ප්‍රමාදයන් සිදුවි ඇති අතර 2019 දි නිවැරදි කිරිමට කටයුතු කරමි. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) 2018 වසරේ පවත්වාගෙන ගොස් තිබූ කර්මාන්ත 17 ක් වෙනුවෙන් පරිසර ආරක්ෂණ බලපත්‍රයක් නිකුත් කිරිමට සභාව කටයුතු කර නොතිබුණි. තවද වලංගු කාල සීමාව අවසන් වී තිබූ පරිසර බලපත්‍ර 06 ක් වෙනුවෙන් නව බලපත්‍ර නිකුත් කිරිමට කටයුතු කර නොතිබුණි. | පරිසර බලපත්‍ර නිකුත් කල යුතු ආයතන හඳුනාගෙන නව බලපත්‍ර නිකුත් කල යුතු අතර නිකුත් කල බලපත්‍ර අළුත් කිරිමට කටයුතු කල යුතු වේ. | 2018 වර්ෂය තුළ පරිසර බලපත්‍ර ලබා දීම සිදු කර ඇත. |
| (ආ) බණ්ඩාරගම ප්‍රාදේශිය සභාව 2018 පෙබරවාරි 15 දිනෙන් පසුව බණ්ඩාරගම හා මිල්ලනිය යනුවෙන් ප්‍රාදේශිය සභා දෙකකට වෙන් වී තිබූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස මිල්ලනිය ප්‍රාදේශිය සභාවට හිමි විය යුතු වත්කම් හා වගකිම බෙදා වෙන් කර ගැනීමට 2019 ජුලි 26 වන විටත් සිදු කර නොතිබුණි. | සභා දෙකට අදාල වත්කම්, වගකීම් කඩිනමින් බෙදා වෙන් කර ගැනීමට කටයුතු කල යුතු වේ. | මෙම කාර්ය සහකාර පළාත් පාලන කොමසාරිස් , කළුතර විසින් කල යුතු අතර ඒ සඳහා සිහි කැදවීම් කර කඩිනම් කර ගැනීමට කටයුතු කරමි. |
| (ඇ) සමාලෝචිත වර්ෂය තුළ ලැබී තිබුණු මහජන පැමිණිලි 05 ක් සම්බන්ධයෙන් සභාව කටයුතු කර නොතිබුණි. | මහජන පැමිණිලි පරික්ෂා කර කඩිනමින් විසඳුම් ලබා දීමට කටයුතු කල යුතුවේ. | සී/ස මැක්සන්ස් ලංකා සමාගමේ තාප්පය ඉදිකිරිමේ ගැටළුව ඉතා දීර්ඝ කාලයක |

සිට පැවත එන අතර අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කරමින් පවති.

3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අනුමත කාර්ය මණ්ඩලය තුළ ද්විතීය මට්ටමේ තනතුරු 04 ක හා ප්‍රාථමික මට්ටමේ තනතුරු 12 ක පුරප්පාඩු පිළිවෙලින් 05 ක් හා 43 ක් විය. | පුරප්පාඩු පුරවා ගැනීමට කටයුතු කල යුතු වේ. | 2019 ජුනි 30 වන විට ද්විතික මට්ටමේ තනතුරු 01 ක පුරප්පාඩු 01 ක් හා ප්‍රාථමික මට්ටමේ තනතුරු 04 ක පුරප්පාඩු 04 ක් පමණක් පවති. බඳවා ගැනීම සඳහා අනුමැතිය ලබා ගැනීමට ඉදිරිපත් කර ඇත |

3.4 ප්‍රසම්පාදනය

3.4.1 ප්‍රසම්පාදන සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | විධිමත් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කල යුතු වේ. | ඉදිරියේදී නිවැරදි කිරිමට කටයුතු කරමි. |

3.4.2 කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| BSR හා HSR රේටයන් නොමැති අයිතමයන් සඳහා විශේෂ රේටයන් භාවිතා කර තිබූ අතර එම රේටයන් සඳහා අනුමැතිය ලබා නොගෙන 2018 වර්ෂයේදී ඉදිකිරීම් කොන්ත්‍රාත් 02 ක් සඳහා රු.1,009,870 ක් ගෙවා තිබුණි. | විශේෂ රේටයන් භාවිත කිරිමේදී එම රේටයන් සඳහා අනුමැතිය ලබාගත යුතුවේ. | ඉදිරියේදී එවැනි මිල ගණන් අනුමත කිරිම සම්බන්ධව අවශ්‍ය උපදෙස් ලබාගෙන ඉදිරි ව්‍යාපෘති සිදු කිරිමට කටයුතු කරමි. |

4. ගිණුම්කටයුතු භාවය හා යහපාලනය
--------------------------------------

4.1 අභ්‍යන්තර විගණනය
------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ---------------------- | ------------ | ---------------------- |
| 2018 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණන වැඩ සටහනක් පිළියෙල කර ඒ අනුව අභ්‍යන්තර විගණනය ක්‍රියාත්මක කර නොතිබුණි. | සභාවේ කටයුතු විධිමත් කිරිම සඳහා අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මක කල යුතු වේ. | අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා ඇත. එහි කටයුතු ක්‍රමවත්ව කිරිමට ඉදිරියේදි කටයුතු කරමි. |